# එ ජා ප අර්බුදය

එ ජා පක්ෂයේ අර්බුදයක් ඇති බව අද වන විට එ ජා පාක්ෂිකයෝ ද පිළිගනිති. එ ජා පක්ෂයට සියලු මැතිවරණවල දී ආධාර කරන එක් ජඩමාධ්‍යයක් අද ඒ පක්ෂයේ අර්බුදය ගැන විවෘතව ම කතාකරන්නේ තමන් කැමති නායකත්වයක් පත්කර ගැනීමට ය. ඒ ජඩමාධ්‍යය සිතන්නේ එ ජා පක්ෂය මැතිවරණවල දී පැරදෙන්නේ එහි වත්මන් නායකත්වය නිසා බව ය. එසේ සිතීමෙන් පෙන්නුම් කරන්නේ ඒ ජඩමාධ්‍යයෙහි නොගුවසිලි බව හා ළාමක බව ය. වත්මන් නායකත්වය එ ජා ප අර්බුදයට යම් ප්‍රමාණයකට වග කිවයුතු බව සැබෑ ය. එහෙත් හුදෙක් නායකත්ව වෙනසකින් එ ජා ප අර්බුදය ජයගත හැකි නො වේ. ඒ සඳහා ප්‍රතිපත්ති වෙනසක් ද සිදුවිය යුතු ය. පක්ෂය ජාතිකත්වය වෙත නැඹුරු විය යුතු ය. එහෙත් එවැනි වෙනසකට කලින් කියන ලද ජඩමාධ්‍යය එකඟ නොවනු ඇත.

එ ජා පක්ෂයට ඉතිහාසයක් ඇත. එය බිහිවූයේ ලංකා කොංග්‍රසයේ අනුප්‍රාප්තිකයකු ලෙස ය. එහෙත් එ ජා ප යනු කොංග්‍රසයේ එසේ බිහිවීමට තිබූ එකම අනුප්‍රාප්තිකයා ද නො වේ. එ ජා ප යනු බිහිවිය හැකිව තිබූ එක් අනුප්‍රාප්තික සංවිධානයක් පමණකි. ලංකා ජාතික කොංග්‍රසය දේශපාලන පක්ෂයක් නො වී ය. එය ද බිහිවූයේ එයට පෙර තිබූ විවිධ සංවිධානවල අනුප්‍රාප්තික සංවිධානයක් ලෙස ය. දහනවවැනි සියවස මෙරට දේශපාලනයේ පැහැදිලි කණ්ඩායම් දෙකක් විය. එක් කණ්ඩායමක් සිංහල බෞද්ධ දේශපාලනයක් මත පිහිටා සිංහල බෞද්ධයන්ගේ නැති වී ගිය අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කෙළේ ය. අනගාරික ධර්මපාලතුමා එහි ගිහි නායකත්වයෙහි විය. එයට අමතර ව මෙරට ඉංගිරිසින්ගේ ඒජන්තයෝ වූහ. ඔවුන්ට අවශ්‍ය වූයේ ඊනියා සිලෝනීස් හෙවත් ලාංකික ජාතියක් නිර්මාණය කර ඉංගිරිසින්ගෙන් සීමිත නිදහසක් ලබාගැනීම ය. ඔවුන් ඒ සඳහා යොදාගත් අවිය වූයේ පෙත්සම ය. තමන් ද ඉංගිරිසින් මෙන් ම සිතන පතන පිරිසක් බව පෙන්වා තමන්ට ද ඉංගිරිසින්ට මෙන් ම යම් පාලනයක් ගෙන යා හැකි යැයි ඉංගිරිසින්ට ඒත්තු ගන්වා යම් නිදහසක් දිනාගැනීම ඔවුන්ගේ අභිලාෂය විය. මේ පිරිසෙහි නායකත්වය මුල දී බර්ගර්වරුන්ට හිමි වු නමුත් දහනවවැනි සියවස ගෙවී ගියේ දෙමළ පවුලකට, එනම් පොන්නම්බලම් - කුමාරස්වාමි පවුලට, ඊනියා ලාංකිකයන්ගේ නායකත්වය හිමිකර දෙමිනි. ඔවුන් අතරින් පොන්නම්බලම් රාමනාදන් නායකයා ලෙස හඳුනාගැනිනි. ඔහු මෙරට දෙමළ (හා ඔහුට අනුව මුස්ලිම්) ජනයා ව්‍යවස්ථාදායක මණ්ඩලයෙහි නියෝජනය කළ අතර ලංකා කොංග්‍රසයේ පළමු සභාපතිවූයේ ඔහුගේ සහෝදරයා වු පොන්නම්බලම් අරුනාෂලම් ය. ඉංගිරිසි ආණ්ඩුවෙන් නයිට් (සර්) පදවියක් ලත් පළමු ආසියාතිකයා වූයේ ඔවුන්ගේ ඥාති සහෝදරයකු වූ මුත්තු කුමාරස්වාමි ය. මේ පිරිස් අතර සිටි සිංහලයෝ බොහෝ විට ඇංග්ලිකන් ක්‍රිස්තියානි වූහ. සමස්තයක් ලෙස ගත්කල ඔවුන් හා සාමාන්‍ය සිංහලයන්, විශේෂයෙන් ම සිංහල බෞද්ධයන්, අතර සම්බන්ධයක් නො වි ය. ඔවුහු ජාති දෙකකට අයත් වූහ.

විසිවැනි සියවසරේ පළමු දශක දෙක ගෙවී ගියේ අනගාරික ධර්මපාලතුමාට සිංහල බෞද්ධයන් අතර තිබූ නායකත්වය නැති කරමිනි. මේ වන විට අමද්‍යප ව්‍යාපාරය වැනි බෞද්ධ සංවිධාන ගොඩනැගී තිබුණු අතර සේනානායකවරු ඉදිරියට පැමිණෙමින් සිටියහ. ඔවුහු ද ප්‍රධාන ඇංග්ලිකන් පාසලෙහි ඉගෙනීම ලැබුව ද බෞද්ධ සංවිධානවල ද කටයුතු කළහ. ඔවුන්ට ප්‍රභූ සමාජයෙහි තැනක් ගැනීම පහසු කටයුත්තක් නො වී ය. එහෙත් පතල් කර්මාන්තයෙන් (හා තවත් අය අරක්කු රේන්දය ලබාගැනීම ආදියෙන්) උපයාගත් ධනයෙන් හා ලබාගත් ඉංගිරිසි අධ්‍යාපනයේ උපකාරයෙන් ජාතිකත්වය ඇසුරෙන් ඔවුහු දේශපාලන ලෝකයේ ද ඉහළට ගියහ. මොවුහු අමද්‍යප ව්‍යාපාරය වැනි බෞද්ධ සංවිධානවල මැදිහත්වීමෙන් යම් පරිමාණයක ජාතිකත්වයක් ද යටත්විජිත විරෝධයක් ද අත්පත් කරගෙන සිටියහ. ඔවුහු කලින් සඳහන් කළ ඉංගිරිසි උගත් ඇංග්ලිකන් නායකයන් මෙන් නොව ජනතාව සමග සම්බන්ධකම් ඇතිකරගත්තෝ වූහ. අවශ්‍ය නම් ඔවුන්ට ප්‍රාදේශික ප්‍රභූ නායකයන් යැයි කිවහැකි ය.

අනගාරික ධර්මපාලතුමාට පසුව පළල් සිංහල බෞද්ධ ජනතාව අතර ජාතික නායකත්වය ලැබුණේ මොවුන්ට ය. (මේ කතාවේ මාක්ස්වාදීන්ගේ මැදිහත්වීම පාද සටහනකට පමණක් සීමා වෙයි. ඩී බී ජයතිලක මහතා බෞද්ධ කටයුතුවල නිරත වූ නමුදු ජනතා බලයක් ගොඩනගා ගැනීමට අපොහොසත් විය. ඇතැම් විට එතුමාට එවැනි දේශපාලන අවශ්‍යතාවක් නොතිබෙන්නට ද ඇත.) එකල සිංහල බෞද්ධ ව්‍යාපාරයේ (ජාතික ව්‍යාපාරයේ) යටත්විජිත විරෝධී අරගලය සංස්කෘතික සංරචකයට එරෙහිව කරන ලද්දක් විය. 1912 හා 1930 අතර කාල පරිච්ඡේදයෙහි ජාතික ව්‍යාපාරයෙහි නායකත්වය සේනානායකවරුන්ට ලැබිණි. එහෙත් සේනානායකලා ධර්මපාලතුමාට බෙහෙවින් වෙනස් වූහ. සේනානායකලාට ජාතික ව්‍යාපාරයෙහි නායකයන් වන අතර ම ලාංකික හෙවත් සිලෝනීස් ප්‍රභූන් සමග ද ඉංගිරිසි ආණ්ඩුකාරයා සමග ද ගනුදෙනු කළ හැකි විය. ඔවුහු ක්‍රමයෙන් ලාංකික ප්‍රභූ සමාජයෙහි ද පිළිගැනීමට ලක්වූහ. එසේ වූයේ කෙසේ ද?

© Prof. Nalin De Silva

සේනානායකලාට මුල දී ලාංකික ප්‍රභූ සමාජයෙහි තැනක් නො වී ය. ඔවුන් ඒ සමාජයෙහි තමන්ට තැනක් ලබාගත්තේ ජාතික ව්‍යාපාරයෙහි නායකයන් ලෙස කටයුතු කර අත්කරගත් ජනබලය උපයෝගී කරගනිමිනි. සේනානායකලාට ජාතිකත්වයක් නොතිබිණි යැයි මෙයින් අදහස් නො කෙරෙයි. ඔවුන් ජාතිකත්වය පාවාදුන් බවක්වත් මෙයින් නො කියැවෙයි. මෙයින් කියැවෙන්නේ එදා ජාතික ව්‍යාපාරයට යා හැකි වූ දුර ය. 1817 ඉංගිරිසින්ට විරුද්ධ පළමු නිදහස් සටනින් පසුව ඉංගිරිසින් විසින් පොඩි පට්ටම් කරනු ලැබූ ජාතික ව්‍යාපාරය පුරං අප්පු, ගොන්ගාලෙගොඩ බණ්ඩා නායකත්වය, අනගාරික ධර්මපාල නායකත්වය පසුකර සේනානායක නායකත්වය ඔස්සේ ඉංගිරිසින්ගේ නව අවධානයකට යොමු විය. ඉංගිරිසින්ට තවදුරටත් ජාතික ව්‍යාපාරය පොඩි පට්ටම් කිරීමට හෝ නොසළකා හැර සිටීමට හෝ නොහැකි විය. එහෙත් ඉංගිරිසිහු මකියාවේලිලාගේ හා කෞටිල්‍යලාගේ ගුරුවරු වූහ. බලය යොදා මැඩ පැවැත්විය නොහැකි වූ සිංහල ජාතිකත්වය උපායෙන් මැඩලන්නේ කෙසේ දැයි ඔවුහු අධ්‍යයනය කළෝ ය. ඔවුන් විසින් පෝෂණය කෙරුණු දෙමළ ජාතිවාදය සිංහලත්වයට එරෙහිව තව දුරටත් යෙදවීමත් සේනානායකලා ඊනියා ලංකිකත්වයෙහි (සිලනීස්) කොටු කරවීමත් ඉංගිරිසින්ගේ ප්‍රතිපත්තිය විය. ලාංකිකත්වය යනු බර්ගර්වරුන් විසින් අටවන ලද්දාවූ ද ඉංගිරිසි ජාතිකත්වයෙහි පරාවර්තනයක් වූ ද ගබ්සා වූ ජාතිකත්වයක් විය. අද ද ඇතැම් පඬියන් උත්සාහ ගන්නේ මේ ගබ්සා වූ ජාතිකත්වයට හැකි නම් යළි ජීවය ලබාදීමට ය.

එ ජා ප යනු පළමුවැනි පාර්ලිමේන්තු මැතිවරණයට පෙර අටවාගන්නා ලද දේශපාලන පක්ෂයක් විය. එය බොහෝ කරුණු අතින් දේශපාලන පක්ෂයක් නොවූ ලංකා ජාතික කොංග්‍රසයේ අනුප්‍රාප්තික දේශපාලන පක්ෂය විය. 1930 වන විට මෙරට දේශපාලන නායකත්වය පොන්නම්බලම් පවුලෙන් සේනානායක පවුලට හා දෙමළ ජනවර්ගයෙන් සිංහල ජාතියට මාරු වී තිබුණේ ය. ඉංගිරිසින්ගේ කැමැත්තට එරෙහිව සිදුවුණු මේ වෙනස සිංහල ජාතිකත්වයෙහි ශක්තිය මත කෙරුණු එකක් විය. 1946 වන විට ඩී එස් සේනානායක මහතා මෙරට දේශපාලනයේ ප්‍රධාන ම චරිතය බවට පත් ව සිටියේ ය. සිංහල, දෙමළ, බර්ගර්, මැලේ ආදී සියලු ඊනියා ලාංකික කොටස් මෙන් ම සිංහල ජාතික ව්‍යාපාරය ද ඔහුගේ නායකත්වය පිළිගත්තේ ය. එහෙත් ඒ ඉතා තාවකාලික දේශපාලන අඩුක්කුවක් පමණක් විය. බටහිර සෘජු නියෝජිතයා වූ ජේ ආර් ජයවර්ධන මෙන් ම දෙමළ ජාතිවාදී ජී ජී පොන්නම්බලම් ද සේනානායක දේශපාලනයට අනුගත නො වී ය. ඒ අතර එ ජා පක්ෂයට එක් ව සිටි සිංහල මහා සභාවේ බණ්ඩාරනායක මහතා නොබෝ කලකින් ම ශ්‍රී ල නි ප නමින් ලිබරල්වාදී පක්ෂයක් පිහිටුවා ගත්තේ ය. වැඩි කලක් නොගොස් සිංහල ජාතික ව්‍යාපාරය ඒ පක්ෂය වටා රොක් වී ඒ පක්ෂය ජාතිකත්වයේ පක්ෂය බවට පත්කර ගැනීමට උත්සාහ කෙළේ ය. පොන්නම්බලම් ද දෙමළ කොංග්‍රසය පිහිටුවාගෙන අයින් විය. පසුව චෙල්වනායගම් බිහිවූයේ ඒ පක්ෂය ඔස්සේ ය.

එ ජා පක්ෂයේ ඉතිරි වූ කොටස් ප්‍රධාන වශයෙන් සේනානායක (පසුව ඩඩ්ලි) හා ජයවර්ධන යටතේ සංවිධානය විණි. පක්ෂ නායකත්වයට තරග වැදි ඒ දෙපිරිස අතර පැවතියේ සුහදත්වයක් නො වේ. ඒ මුලුමනින් ම බටහිර ගැති ඊනියා ලාංකික පිරිස හා ලාංකික වුව ද තරමක් ජාතිකත්වයට නැඹුරු වූ පිරිස අතර කෙරුණු බෙදීමක් විය. එ ජා පක්ෂයේ ඡන්ද පදනම සේනානායකලා වටා විය. එහෙත් ජේ ආර් සිතා සිටියේ ඒ එ ජා ප ඡන්ද පදනමක් බව ය. නායකත්වය සඳහා දශක ගණනාවක් බලා සිටි යැංකි ඩිකි නම් අන්වර්ථ නාමයෙන් ප්‍රසිද්ධ වූ ජේ ආර් හැත්තෑවේ දශකයේ පක්ෂ නායකත්වයට ද රටේ නායකත්වයට ද පත්විය. ඔහු තම බෑණා කෙනකු වූ රනිල් වික්‍රමසිංහ තමාගෙන් පසු පක්ෂ නායකත්වයට ගෙන ඒමට කටයුතු කෙළේ ය. ජේ ආර් ගෙන් පසුව යම් ජාතිකත්වයක් තිබූ ප්‍රේමදාසගෙන් හා විජේතුංගගෙන් පසු රනිල් පක්ෂ නායකත්වයට පත්විය. 2002 දී ඔහු අගමැති වූ නමුත් අද වන විට සිංහල ජාතිකත්වයේ ශක්තිය මත මහුගේ පක්ෂ නායකත්වයට ද අභියෝග එල්ල වී ඇත. අද එ ජා පක්ෂයේ ජාතිකත්ව ඡන්ද පදනම අඩුවෙමින් පවතියි. ජේ ආර් ගණන් බැලුයේ ජාතිකත්ව ඡන්ද කොටස සෑමදාමත් එ ජා පක්ෂයට තිබේවිය යන උපකල්පයෙනි. ඔහුගේ සමානුපාතික ඡන්දයට ද පදනම වූයේ එය ය. අද එ ජා පක්ෂයට ජාතිකත්ව ඡන්ද පදනම රැකගෙන බලයට පැමිණිය හැක්කේ පක්ෂය ජාතිකත්වයට නැඹුරු වීමෙන් පමණ ය. සජිත් ප්‍රේමදාස තමා මැදවච්චි පාමංකඩ කතා නොකී බව කියන්නේ ලාංකික ජාතියෙන් නායකත්වයට තරග වැදිය හැකි රවි කරුණානායකට  ද වදින්නට ය. එහෙත් එපමණකින් එ ජා පක්ෂයට ජාතිකත්වයේ පක්ෂයක් විය නො හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva